# පීල් දිස්ත්‍රික්ක පාසැල් මණ්ඩලයේ (Peel District School Board) විශේෂ අධ්‍යාපනය : පුද්ගලික අධ්‍යාපන සැලැස්ම (අයි.ඊ.පී.) Individual Education Plan (IEP)

## A Guide for Parents
## දෙමාපිය අත්පොත

### පුද්ගලික අධ්‍යාපන සැලැස්මක් (Individual Education Plan) යනු කුමක්ද?

මෙම සැලැස්ම පීල් දිස්ත්‍රික්ක පාසැල් මණ්ඩලයට (Peel District School Board) ඔබේ දරුවාගේ අධ්‍යාපනය සඳහා සහය දැක්විය හැකි මාර්ගයකි. අපට ඔබේ දරුවාගේ රුචිකම්, දක්ෂකම්, අවශ්‍යතා සහ ඉලක්ක අවබෝධ කර ගැනීමට අවශ්‍යය. ඕනෑම දරුවෙකු පිළිබඳව එම විස්තර දැන ගැනීම අපට වැදගත්ය. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් සඳහා මෙම විස්තර පුද්ගලික අධ්‍යාපන සැලසුමක (Individual Education Plan) ඇතුලත්කර ඇත. ඔබේ දරුවාගේ සාර්ථකත්වය උදෙසා අවශ්‍ය විශේෂ අධ්‍යාපන වැඩසටහන් සැපයීමට මෙම සැලැස්ම අපට ආධාරවේ.

### සැලැස්ම වර්ධනය කෙරුනේ කෙසේද?

ඔබේ දරුවාගේ පාසැලෙහි සිටින විශේෂ අධ්‍යාපන කණ්ඩායම මගින් පහත සඳහන් අයගේ ආධාරද ඇතිව සැලැස්ම සකස් කරයි.

- ඔබේ දරුවාගේ ගුරුවරුන්
- ගයිඩන්ස් කවුන්සලර්වරුන්, මීට පෙර මෙම කාර්යයට සහභාගිවූ විශේෂ අධ්‍යාපන කාර්ය මණ්ඩලය, විදුහල්පති, ප්‍රජා සංවිධාන හෝ සේවා වල කාර්ය මණ්ඩලය වැනි වෙනත් නිපුණයින්
- මීට පෙර තිබූ පුද්ගලික අධ්‍යාපන සැලැස්ම (අයි.ඊ.පී) (Individual Education Plan), ඔබේ දරුවාගේ ඔන්ටේරියෝ අධ්‍යාපන වාර්ථාව (Ontario Student Record) හෝ ඇගයීම් (ඔබේ දරුවාගේ අධ්‍යාපනික, සෞඛ්‍ය හෝ හැසිරීම පිළිබඳ වැනි) ආදී වෙනත් තොරතුරු .
- ඔබේ පවුල. දෙමපියකු ලෙස ඔබ මෙම සැලැස්ම නිර්මාණය කිරීම උදෙසා වැදගත් කාර්යයක් ඉටු කරයි. දරුවා පිළිබඳව ඔබ පවසන තොරතුරු තුලින් පාසැල දරුවාගේ පෞර්ෂය, වර්ධනය, ඉගෙනුම සහ වඩා රුචිදේ පිළිබඳව අවබෝධ කර ගනියි. සැලැස්ම නිර්මාණය කිරිමට ඔබේ දරුවාටද සහභාගි විය හැක (වයස අවුරුදු 16 න් පසු මේ සඳහා අයිතියක් ඇත). අධ්‍යාපන ඉලක්ක සැදීම වැනි ක්‍රියා වලින් සිසුන් මෙම ක්‍රියාදාමයට සහභාගීවූ විට ඔවුන් තම ඉගෙනීම පිළිබඳව වඩා වැඩි වගකීමක් ගනී.

මෙම සැලැස්ම ඔබේ දරුවා විශේෂ අධ්‍යාපනය ආරම්භ කර දින 30ක් ඇතුලත සැකසිය යුතුවේ. ඔබට මෙම සැලැස්මෙහි පිටපතක් ලැබෙන අතර තවත් පිටපතක් ඔබේ දරුවාගේ ඔන්ටේරියෝ ශිෂ්‍ය වාර්ථාව (Ontario Student Record) වෙත යොමු කෙරේ.

### මෙම සැලැස්මෙහි අඩංගු වන්නේ මොනවාද?

ගුරුවරුන් සහ සහයක කාර්ය මණ්ඩලය විසින් මෙම අධ්‍යාපන සැලැස්ම ඔබේ දරුවාගේ අවශ්‍යතාවයන් සපුරාලීමට සහ ඔහුගේ හෝ ඇයගේ ප්‍රගතිය ඇගයීම සඳහා භාවිතා කරයි. මෙම සැලැස්මෙහි පහත සඳහන් විස්තර ඇතුලත්වේ.

- විශේෂත්වය සහ නියමිත ස්ථානය

- ඔබේ දරුවාගේ අධ්‍යාපන අවශ්‍යතා, නිපුනතා, අධ්‍යාපන ශෛලීය සහ ඇගයීම්

- ඔබේ දරුවා විශේෂ සහය ලබන විෂයන්, පාඨමාලා හෝ වැඩ සටහන්

- ඔබේ දරුවාට අවශ්‍ය මොන අන්දමේ ආධාර සහ විවිධ ක්‍රමද යන්න

- ඔබේ දරුවාට ඉටුකර ගැනීමට හැකි දේ පිළිබඳව සහ අපට, ඔහු උගත්දේ පිළිබඳව මැණීමට ආධාර දෙන ඉලක්ක සහ අපේක්ෂාවන්.

- අවුරුදු 14 ක් හෝ ඊට වැඩි දරුවන්ට ඔවුන්ගේ ඊළඟ පියවර වන ද්විතීය පාසැලට යාම, වෙනත් අධ්‍යාපන කටයුතු, රැකියා ස්ථානය හෝ ප්‍රජාව තුල ජීවත්වීම වැනි දේ ආදියට සැලැස්මක් ලෙස

බොහොමයක් සිසුන්ගේ ප්‍රගතිය ඔවුන්ගේ ප්‍රගති වාර්ථාවේ සටහන් වනු ඇත. ඔබේ දරුවාගේ වැඩ සටහන අනුව සමහර විට පුද්ගලික අධ්‍යාපන සැලසුමෙහිද (Individual Education Plan) ප්‍රගතිය සටහන් වනු ඇත.

**සැලසුම වෙනස් විය හැකිද?**

ඔබේ දරුවාගේ ගුරුවරයා විසින් වසර පුරාම අධ්‍යාපන සැලැස්මෙහි ඇති නිවැරදි ක්‍රම පිළිබඳව සටහන් කරන අතරම ක්‍රම පිළිබඳව නැවත වැරදි නිවැරදි බව සොයා බැලීමද කරයි. මෙය ක්‍රියා දාමයේ කොටසකි.

සැලසුම මගින් එක් පාසැල් වර්ෂයකට ඉලක්ක සකස් කරන අතර නියමිත ආකාරයට වාර්ෂිකව එය නැවත පරීක්ෂා කර බලා සුදුසු අන්දමට වෙනස් කම් සිදු කෙරේ. ඒ සමඟම පාසැල මගින් ඔබේ දරුවාගේ ප්‍රගතිය පිළිබඳව වසර පුරාම තක්සේරු කෙරේ. බලාපොරොත්තු වූවාට වඩා ඔබේ දරුවාගේ අධ්‍යාපනය දියුනු වනවා නම් හෝ සෙමින් සිදුවනවා නම් වැනි කරුණු අනුව අප අවශ්‍ය පරිදි සැලැස්මට වෙනස් කම් සිදු කර නව ඉලක්ක සාදමු.

**වැඩි විස්තර ලබා ගත හැක්කේ කෙසේද?**

විශේෂ අධ්‍යාපනය සහ පුද්ගලික අධ්‍යාපන සැලසුම (Individual Education Plan) පිළිබඳව වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර :

- ඔබේ දරුවාගේ ගුරුවරයා හෝ විදුහල්පති සමඟ කථා කරන්න.

- ඔබේ දරුවාගේ පාසැලෙහි විශේෂ අධ්‍යාපනය භාර ගුරුවරයා අමතන්න.

- පීල් දිස්ත්‍රික්ක පාසැල් මණ්ඩලයේ (Peel District School Board) වෙබ් අඩවිය වෙත යන්න, www.peelschools.org/speced.

- ඔන්ටේරියෝ අධ්‍යාපන දෙපාර්තුමේන්තුවෙහි (Ontario Ministry of Education) ඇති www.edu.gov.on.ca වෙත ගොස් ප්‍රාථමික සහ ද්විතීය අධ්‍යාපනය තෝරා ගෙන විශේෂ අධ්‍යාපන පුරුක තෝරා ගන්න.

- දුරකථන අංක 905-890-1099 හෝ 1-800-668-1146 දිගු අංකය 2345 තුලින් පීල් දිස්ත්‍රික්ක පාසැල් මණ්ඩලය (Peel District School Board) අමතන්න.